**හිමිකම් රක්ෂණ අරමුදල - 2023**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හිමිකම් රක්ෂණ අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මග හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 71 ඡේදයට අනුකූලව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මාස 12 ට අඩු රු.102,468,413 ක හා මාස 12 ට වැඩි රු.81,951,350 ක ආයෝජන වර්ගීකරණය කර ගිණුම්ගතකර නොතිබුණි. | එළඹෙන ගිණුම් වර්ෂයේදී නිවැරදි වර්ගීකරණයෙන් යුක්තව ආයෝජන ගිණුම්ගත කිරීමට සටහන් කරගත් බව දන්වා තිබුණි. | යොමුගත ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|---|
| ආදායම | - | 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග අංක 42 (ආ) ප්‍රකාරව, හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සති 02 කට වරක් හිමිකම් ආදායම් සම්බන්ධ වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ලබාදිය යුතු වුව ද, හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාල 28 ක ආදායම් වාර්තා 672 කින් වාර්තා 50 ක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී නොතිබුණු අතර, අරමුදලේ ආදායම් අදාළ කාර්යාල විසින් බැංකු ගතකරන මුදල් වටිනාකම අනුව ගණනය කර තිබුණි. ඒ සඳහා ආදායම් වාර්තා පදනම්කර නොගැනීම හේතුවෙන් අරමුදලේ මුළු ලැබීම්වල නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය. | අදාළ වාර්තා නියමිත අයුරින් ප්‍රධාන කාර්යාලයට ලබා නොදීම හා දෛනික බැංකු වාර්තාව පදනම් කරගෙන දෛනිකව ආදායම්, මුදල් පොතට ඇතුළත් කිරීම නිසා මෙම තත්ත්වය වාර්තා වී ඇති බව දන්වා තිබුණි. | ආදායම් නිවැරදිව වාර්තා කළ යුතු ය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග අංක 42 (ඉ) | සෑම දින 14 ක් අවසානයේදී ම හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එකතු කරගන්නා මුදල් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ප්‍රධාන මුදල් පොතට වෙන් වෙන් වශයෙන් හර කළ යුතු වුව ද, දෛනික ආදායම් ලෙස දිනපතා ලැබීම්වල එකතුවක් මුදල් පොතට හර කර තිබුණි. | බැංකු වාර්තා අනුව එක් එක් කාර්යාල වශයෙන් ඇතුළත් කිරීම ප්‍රායෝගික වශයෙන් අපහසු වී ඇති බව දන්වා තිබුණි. | ආදායම් නිවැරදිව වාර්තා කළ යුතු ය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.54,885,560 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.25,466,815 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.29,418,745 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම රු.20,816,210 කින් වැඩිවීම හා භාණ්ඩාගාර ආයෝජන පොළී ආදායම රු.8,608,046 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| (අ) 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග 42(ආ) හා (ඇ) ප්‍රකාරව ඇතැම් හිමිකම් කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලය වෙත එවන ලද හිමිකම් ආදායම පිළිබඳ වාර්තා "ආර්.ජී.ටී/අයි.එෆ් 03" ආකෘතියට අනුකූල නොවුව ද, කළමනාකරණය විසින් නිවැරදි ආකෘතිය සහිත වාර්තා ගෙන්වා ගැනීමට කටයුතුකර නොතිබුණි. | ඉදිරි මුදල් වර්ෂයේ සිට "ආර්.ජී.ටී/අයි.එෆ් 03" ආකෘතියට අනුකූලව හිමිකම් ආදායම් වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත නියෝගයට අනුගත විය යුතු ය. |
| (ආ) අරමුදලේ මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කළ බවට සනාථ වන කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර්තාව විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් එහි සභාපතිවරයා විසින් පමණක් මූල්‍ය ප්‍රකාශන අත්සන්කර තිබුණි. | අරමුදලෙහි කළමනාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර එකී මාර්ගෝපදේශය නැවත විමසා බලා කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත විධිවිධානවලට අනුකූල විය යුතු ය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරීමේදී පාර්ශවකරුවන්ට සිදුවන අලාභ සඳහා රජය විසින් වන්දි ප්‍රදානය කිරීමේ අරමුණින් හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවා තිබුණද, වන්දි ඉල්ලා නඩු පැවරීමක් හෝ අධිකරණ ආඥාවක් මඟින් වින්දිතයකු නම්කර නොමැතිවීම නිසා හෝ 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු හානිපූරණ වන්දි මුදලක් ගෙවීම්කර නොතිබුණි. තව ද, මෙම අරමුදල සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි පොදු ජනතාව දැනුවත් කිරීම් සිදුකර නොතිබුණි. | අධිකරණ තීන්දුවක් මඟින් වින්දිතයෙක් නම් කර නොමැති බැවින් මේ වන තෙක් අරමුදල මඟින් කිසිදු හානිපූරණ වන්දියක් ගෙවා නොමැති අතර, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා සාකච්ඡා පැවැත්වෙන බැවින් ඉදිරියේදී අරමුදල පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදුකරන බව දන්වා තිබුණි. | පොදු මහජනතාව දැනුවත් කර අරමුදලේ මූලික අරමුණ ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතු යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 08 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණ ද, රැස්වීම් වාර 04 ක් පමණක් පවත්වා තිබුණි. | හිමිකම් රක්ෂණ අරමුදලේ කළමනාකරණ මණ්ඩලය විසින් කාර්තුවකට එක් රැස්වීමක් පමණක් පැවැත්වීමට ගත් තීරණ අනුව රැස්වීම් වාර 04 ක් පමණක් පැවැත් වූ බව දන්වා තිබුණි. | ක්‍රියාකාරී සැලස්මට අනුව කටයුතු කළ යුතු යුතු ය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ අවස්ථා හතරකදී අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 68 සිට සියයට 1,422 දක්වා විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 4 ක් පමණක් පැවැත්වීම හා විගණන කළමනාකරණ රැස්වීම් වාර එකක් පමණක් පැවැත්වීම හේතුවෙන් සංග්‍රහ වියදම් අඩුවීම, ලිපිද්‍රව්‍ය සඳහා ඇස්තමේන්තුකර තිබූ මුදල ප්‍රමාණවත් නොවීම හා ආර්ථිකයේ පවතින උද්ධමනකාරී තත්ත්වය ද මෙයට හේතුවී ඇති බවත් දන්වා තිබුණි. | වියදම් ඇස්තමේන්තුව නිවැරදිව හා තාත්විකව සකස්කළ යුතු ය. |